# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2460/40 - 2025 ඔක්තෝබර් මස 31 වැනි සිකුරාදා - 2025.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ දඹුල්ල මහා නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන දඹුල්ල මහා නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ දඹුල්ල මහා නගර සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ හෙනරත් හෙට්ටි ආරච්චිගේ දේශප්‍රිය ජාලිය හේමන්ත ඕපාත අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම දඹුල්ල මහා නගර සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රාජගුරු රාජකරුණා වාසල මුදියන්සේලාගේ ක්‍රිශාන්ත මදුමාල් හුලංගමුව නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

දඹුල්ල මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරි හෙට්ටිගේ ආසිරි එරංග පුෂ්පකුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් රාජගුරු රාජකරුණා වාසල මුදියන්සේලාගේ ක්‍රිශාන්ත මදුමාල් හුලංගමුව, දඹුල්ල මහා නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**එච්. ඒ. ඊ. පුෂ්පකුමාර,**
තේරීම්භාර නිලධාරි,
දඹුල්ල මහා නගර සභාව.

2025 ඔක්තෝබර් මස 31 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතලේ.

EOG 10 - 0298

1A - PG 7325 — 08 (2025/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*